කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
DEPARTMENT OF METEOROLOGY

383, බෞද්ධාලෝක මාවත කොළඹ 07, ශ්‍රී ලංකාව | 383, பௌத்தாலோக்க மாவத்தை, கொழும்பு 07, இலங்கை | 383, Bauddhaloka Mawatha, Colombo 07, Sri Lanka

තද සුළං සහ රළු මුහුදු

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
ස්වාභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය

රතු • ක්‍රියාත්මක වන්න

නිකුත් කළේ	වලංගු වන්නේ (සිට)	වලංගු වන්නේ (දක්වා)	නිවේදන අංකය
14 නොවැම්බර් 2026 05:00 PM	**14 නොවැම්බර් 2026** 05:30 PM	**16 නොවැම්බර් 2026** 05:30 PM	**MSA/26/11/14/01-SI**


⚠ **ගිනිකොනදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ යාත්‍රා කරන බහුදින ධීවර යාත්‍රා සහ කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය, පොතුවිල් හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන්වන මුහුදු ප්‍රදේශ සඳහා.**

ශ්‍රී ලංකාවට නැගෙනහිරින්, බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව පවතින අඩු පීඩන කලාපය අද උදෑසන වන විට මඩකලපුව සිට කි.මී. 650 ක් පමණ දුරින්, නැගෙනහිර දෙසින් ස්ථානගත වී තිබුණි. තවදුරටත් මෙම පද්ධතිය ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළට ඇතින් උතුරට බරව වයඹ දෙසට ගමන් කර හෙට දින (නොවැම්බර් 15) වන විට 'පීඩන අවපාතයක්' දක්වා වර්ධනය වීමට බොහෝ දුරට ඉඩ ඇත. තවදුරටත් මෙම පද්ධතිය උතුරට බරව වයඹ දෙසට ගමන් කරමින්, නොවැම්බර් මස 16 වැනිදා පමණ වන විට දකුණු සහ යාබද බටහිර මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව සුළි කුණාටුවක් බවට වර්ධනය වීමට හැකියාව පවතී.

එමනිසා, 2026 නොවැම්බර් 14 දින උදෑසන 05.30 සිට, උතුරු අක්ෂාංශ 05ත් 15ත් සහ නැගෙනහිර දේශාංශ 80ත් 90ත් අතර මුහුදු ප්‍රදේශවල සහ කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ පොතුවිල් හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවලත් නැවත දැනුම් දෙනතුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වැලකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ. එම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතු වල යෙදෙන ප්‍රජාවන් ආරක්ෂිත ප්‍රදේශ කරා යාත්‍රා කරන ලෙසත් උපදෙස් දෙනු ලැබේ.

මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ධීවර සහ නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

www.meteo.gov.lk
https://was.meteo.gov.lk
කාලගුණවිද්‍යාඥ: S. Jayasekara
0112686686




පුරෝකථනය කරන ලද ස්ථාන සහ තීව්‍රතා:

දිනය	වේලාව	ස්ථානය (අක්ෂාංශ /දේශාංශ)	කැළඹිලි ස්වභාවය
2026-11-14	ප .ව .05.30	7.6/87.2	අඩු පීඩන කලාපය
2026-11-15	පෙ .ව .05.30	8.8/86.7	පීඩන අවපාතය
2026-11-15	පව .. 05.30	10.0/86.6	පීඩන අවපාතය
2026-11-16	පෙ .ව .05.30	10.8/86.5	ගැඹුරු පීඩන අවපාතය
2026-11-16	පව .. 05.30	11.5/86.4	සුළි කුණාටුව
2026-11-17	පෙ .ව .05.30	12.0 /86.3	සුළි කුණාටුව
2026-11-17	ප .ව .05.30	12.6/86.1	සුළි කුණාටුව
2026-11-18	පෙ .ව .05.30	13.2/85.9	වණ්ඩ සුළි කුණාටුව

කාලගුණවිද්‍යාඥ: S. Jayasekara
0112686686

නිරීක්ෂණය කළ සහ පුරෝකථනය කළ ගමන් මාර්ගය:



Source : https://rsmcnewdelhi.imd.gov.in/

මෙම පද්ධතිය සම්බන්ධ මීළඟ නිවේදනය නොවැම්බර් 15 දින සවස 05.00ට නිකුත් කරනු ලැබේ.

www.meteo.gov.lk
https://was.meteo.gov.lk
කාලගුණවිද්‍යාඥ: S. Jayasekara
0112686686